# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

# 11 ශ්‍රේණිය - පළමු වාර පරීක්ෂණය

**1 කොටස** **කාලය: පැය 01**

01. පහත ඒවා අතරින් දත්තයක් නොවන්නේ,
 i. පිදුරුතලාගල කන්දේ උස iii. මල්වතු ඔයේ දිග
 ii. ශ්‍රී ලංකාවේ ජනගහණ වර්ධන වේගය iv. බිලුරේ තැටියක මිල

02. සිදුරුපත් සංකල්පය(Punch Card System)භාවිතා කරන ලද්දේ,
 i. බ්ලේස් පැස්කල් iii. චාර්ල්ස් බැබේජ්
 ii. හර්මන් හොලරිත් iv. ජෝශප් ජැකුවාඩ්

03. ඉ- රාජ්‍යය මඟින් රටක පුරවැසියන්ට ලැබෙන සේවාවක් නොවන්නේ,
 i. රාජ්‍ය ආයතන බිල්පත් ගෙවීම් සේවා iii. රථවාහන බලපත්‍ර නිවසේ සිට අලුත් කිරීම
 ii. අන්තර්ජාලය මඟින් වීසා අයදුම් කිරීම iv. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ සේවාවන්

04. 564 දශමය සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටමය හා ෂඩ්දශමය සංඛ්‍යා පිළිවෙලින් වනුයේ,
 i. $1064_8$ හා $234_{16}$ iii. $164_8$ හා $234_{16}$
 ii. $234_8$ හා $1064_{16}$ iv. $601_{16}$ හා $432_{16}$

05. $10110_2$ ,$3B1_{16}$,$63_8$,$25_{10}$ යන සංඛ්‍යා ආරෝහණ පටිපාටියට සකස්කළ විට පිළිතුර වන්නේ,
 i. $10110_2$ , $25_{10}$,$63_8$ ,$3B1_{16}$ iii. $25_{10}$, $10110_2$ , $3B1_{16}$,$63_8$
 ii. $3B1_{16}$, ,$63_8$$25_{10}$,$10110_2$ iv. $3B1_{16}$, $63_8$ , $10110_2$, $25_{10}$

06. 12 C $_{16}$ හි ද්විමය අගය දැක්වෙන පිළිතුර කුමක්ද?
 i. $101101100_2$ ii. $100101101_2$ iii. $100101100_2$ iv. $101001101_2$

07. පහත සංඛ්‍යා අතුරින් කුඩාම සංඛ්‍යාව වනුනේ,
 i. $15_{10}$ ii. $27_8$ iii. $11011_2$ iv. $24_{10}$

08. දෘඩ පිටපත් මෘදු පිටපතක් බවට පරිවර්තනය කරන්නේ කවර උපක්‍රමය මඟින්ද?
 i. මුද්‍රණ යන්ත්‍රය iii. සුපරීක්ෂකය
 ii. පරිගණක තිරය iv. මෙහෙයුම් යටිය

09. $28_{10}$ BCD ආකාරයෙන් දක්වන්න.
 i. 00101000 ii. 00110010 iii. 00101101 iv. 10000010

10. පරිගණකයේ ප්‍රාථමික මතකය බෙදිය හැකි කොටස් තුන මොනවාද?
 i. පඨන මාත්‍ර මතකය,නශ්‍ය මතකය,සසම්භාවී ප්‍රවේශ මතකය
 ii. පඨන මාත්‍ර මතකය,වාරක මතකය,සසම්භාවී ප්‍රවේශ මතකය
 iii. වාරක මතකය,නශ්‍ය මතකය,සසම්භාවී ප්‍රවේශ මතකය
 iv. වාරක මතකය,නශ්‍ය මතකය,පඨන මාත්‍ර මතකය

11. පඨන මාත්‍ර මතකය,නශ්‍ය මතකය,වාරක මතකය උසස් පෙළ ප්‍රතිඵල මත සිසුවෙකුට විශ්ව විද්‍යාලයේ උපාධි පාඨමාලාවක් හඳුන්වා දී ඇත .ඒ අනුව ගිණුම්කරණය (A) හා ආර්ථික විද්‍යාව(B)යන විෂයයන් අනිවාර්යය වන අතර ව්‍යාපාර අධ්‍යයනය (C) හෝ තොරතුරු තාක්ෂණය (D)තෝරාගත යුතුය.මෙම තෝරා ගැනීම බූලිය ප්‍රකාශයක් මඟින් නිවැරදිව දැක්වෙනුයේ,
 i. (A AND B) AND (C OR D) iii. (A OR B) AND (C AND D)
 ii. (A AND B) OR (C OR D) iv. (A OR B) OR (C AND D)

12. පහත ප්‍රකාශ අතුරින් නාභිය (Hub) හා ස්විචය (Switch) පිළිබඳ සත්‍ය ප්‍රකාශ වන්නේ,
 a) ස්විචයේ දත්ත සම්ප්‍රේෂණ වේගය නාභියේ දත්ත සම්ප්‍රේෂණ වේගයට වඩා වැඩි වේ.
 b) නාභිය මඟින් සම්ප්‍රේෂණය විය යුතු දත්ත සියලුම පරිගණක වෙත යවයි.
 c) ස්විචය මඟින් සම්ප්‍රේෂණය විය යුතු දත්ත අදාළ පරිගණකය වෙත යවයි.
 d) නාභිය ඒකපථ දත්ත සම්පේෂණය සිදුකරන අතර ස්විචය ද්විපථ දත්ත සම්ප්‍රේෂණය සිදු කරයි.
 i.a,b,d ii.b,c,d iii.a,b,c iv.a,c,d

13. වාරක මතකය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
 i. නිතර භාවිතා කරන දත්ත තාවකාලිකව ගබඩා කරයි
 ii. නිතර භාවිතා කරන දත්ත ස්ථිරව ගබඩා කරයි
 iii. නිතර භාවිතා නොකරන දත්ත තාවකාලිකව ගබඩා කරයි
 iv. නිතර භාවිතා නොකරන දත්ත ස්ථිරව ගබඩා කරයි

14. ගුරුවරයෙකු විසින් සකස් කරන ලද විද්‍යුත් සමර්පණයක අන්තර්ගතය තම කට හඬින් ම පටිගත කොට ඉදිරිපත් කරන ලදි.මේ සඳහා ඔහු විසින් යොදාගනු ලැබූ ආදාන සහ ප්‍රතිදාන උපක්‍රම පිළිවෙලින් දැක්වෙන්නේ,
   I. වෙබ් කැමරාව සහ මුද්‍රණ යන්ත්‍රය
   II. මයික්‍රොපෝනය සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණය
   III. යතුරු පුවරුව සහ පරිගණක තිරය
   IV. බහුමාධ්‍ය ප්‍රක්ෂේපණය සහ මයික්‍රොපෝනය

15. 2TB සඳහා තුල්‍ය වන්නේ,
   i. 2 X $10^6$ GB
   ii. 2 X $10^6$ KB
   iii. 2 X $10^6$ MB
   iv. 2 X $10^9$bytes




16. ඉහත තාර්කික පරිපථය සඳහා වන නිවැරදි බූලිය ප්‍රකාශනය වන්නේ,
   i. (P.Q)+(Q.R’)
   ii. (P+Q).(Q.R’)
   iii. (P+Q)+(Q+R’)
   iv. (P+Q).(Q+R’)

17. පහත දැක්වෙන මතක උපාංග අතුරින් නශ්‍ය මතක ගණයට අයත් උපාංග පමණක් ඇතුළත් වනුයේ,
   i. ප්‍රධාන මතකය,මතක රෙජිස්තර,ද්විතියික ආචයනය
   ii. වාරක මතකය, මතක රෙජිස්තර,පඨන මාත්‍ර මතකය
   iii. ප්‍රධාන මතකය, පඨන මාත්‍ර මතකය ,වාරක මතකය
   iv. සසම්භාවී ප්‍රවේශ මතකය, වාරක මතකය,මතක රෙජිස්තර,

18. කෙවෙනිය හා කෙවෙනියට සම්බන්ධ කළ හැකි උපක්‍රම පිළිවෙලින් වන්නේ,
   i. බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය,ජාල ස්විචය
   ii. ජාල ස්විචය, බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය
   iii. බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය,සුපරීක්ෂකය
   iv. යතුරු පුවරුව, ජාල ස්විචය

19. පරිගණක ජාල දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකිනෙකට සම්බන්ධ කිරීමට භාවිතා කරන උපාංගය කුමක්ද?
   i. ජාලකරණ ස්විච්චය
   ii. මොඩමය
   iii. ජාල අතුරු මුහුණත් කාඩ්පත
   iv. මාර්ගකාරකය

20. පහත සඳහන් වගන්ති සලකා බලන්න.
   a. ප්‍රකාශ තන්තු වලට වඩා ඇඹරී යුගල රැහැන් මිල අධික වේ
   b. ඇඹරී යුගල රැහැන් වලට වඩා ප්‍රකාශ තන්තු වේගයෙන් දත්ත සම්ප්‍රේෂණය කරයි.
   ඉහත ප්‍රකාශ අතුරින්,
   i. a සත්‍ය හා b අසත්‍ය වේ
   ii. a අසත්‍ය හා b සත්‍ය වේ
   iii. ප්‍රකාශ දෙකම සත්‍ය වේ
   iv. ප්‍රකාශ දෙකම අසත්‍ය වේ

21. මුදු ස්ථල (Ring Topology) හි ලක්ෂණයක් නොවන්නේ,
   i. සියලුම උපාංග සමඟ සන්නිවේදනය සිදුවේ.
   ii. සන්නිවේදන වේගය වැඩිය.
   iii. සාපේක්ෂව පිරිවැය වැඩිවීම
   iv. සන්නිවේදනය අතරතුර අවහිරතා අවම වීම.

22. C සඳහා වූ ද්විමය ඇස්කි (ASCII) අගය $1000011_2$ නම් G සඳහා වූ දශමය අගය වනුයේ,
   i. 69
   ii. 70
   iii. 71
   iv. 72

23. ඉදිරිපත් කිරීමේ මෘදුකාංගයක් වන Microsoft Power Point කදා දැක්මක්(Slide Show) අතරතුරේදී B යතුර තදකිරීම මඟින් සිදුවනුයේ,
   i. තිරය සුදුපාට වීමයි
   ii. තිරය කළුපාට වීමයි
   iii. ඉදිරි පිටුවට යාමයි
   iv. ඉදිරිපත් කිරීම අවසන් වීමයි.

➢ පහත දත්ත පාදක වගුව ඇසුරින් 24, 25, 26 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

Student _Table

| St_Id | St_name | Address | TP_No | Course_ID |
|---|---|---|---|---|
| 1011 | Amal | Anuradhapura | 025-1234567 | S156 |
| 1012 | Namal | Colombo | 011-2546789 | D326 |
| 1013 | Nuwani | Kandy | 081-4567890 | S156 |
| 1014 | Ruwani | Anuradhapura | 025-1254697 | C120 |

24. Student_Table හි ප්‍රාථමික යතුර ලෙස තෝරා ගැනීමට වඩාත් සුදුසු වන්නේ කුමන ක්ෂේත්‍රය ද?
i. St_Id
ii. St_name
iii. Course_ID
iv. Address

25. Tp_No සඳහා සුදුසු දත්ත ප්‍රරූපය වන්නේ,
i. Text
ii. Number
iii. Boolean
iv. Date & Time

26. මෙම වගුවේ ඇති ක්ෂේත්‍ර ගණන හා රෙකෝඩ් ගණන පිළිවෙලින් වන්නේ,
i. 5 හා 4 ii. 4හා 5 iii. 5 හා 5 iv. 8 හා 5

27. Ms-Access වලදී යොදාගන්නා විමසුම් (Query) වල ප්‍රධාන අරමුණ වන්නේ,
i. දත්ත ප්‍රවේශය හා ඇතුළත් කිරීම පහසු කිරීම
ii. දත්ත හා තොරතුරු අලංකාර ලෙස ඉදිරිපත් කිරීම
iii. දත්ත ඇතුළත් කිරීම සඳහා වන අතුරු මුහුණතක් සැපයීම
iv. ඉදිරිපත් කරන ලද නිර්ණායක වලට ගැළපෙන වාර්තා පමණක් ඉදිරිපත් කිරීම

28. දත්ත පාදක මෘදුකාංගයක් නොවන්නේ,
i. Ms-Access
ii. Apple Keynote
iii. Open Office Base
iv. Oracle

29. දත්ත සමරික්තතාව යනු,
i. සම්බන්ධිත වගුවේ ප්‍රාථමික යතුරු ක්ෂේත්‍රයේ අනුරූපී දත්ත පමණක් පැවතීම
ii. ආගන්තුක යතුර භාවිතා කරමින් වගු 2 ක් අතර සම්බන්ධයක් ගොඩනැඟීම
iii. වගුවල එක් එක් තීරුවල එකම දත්ත නැවත නැවත ඇතුළත් වීම
iv. එකම දත්තය වගු කිහිපයක තැන්පත් වීම

30. පහත අංග අතුරින් වදන් සැකසුම් මෘදුකාංග හා විද්‍යුත් සමර්පණ මෘදුකාංග යන දෙකෙහිම දක්නට ඇති පොදු අංගය කුමක්ද?
i. වචන සෙවීම හා ප්‍රතිස්ථාපනය
ii. තැපැල් මුසුව
iii. අක්ෂර වින්‍යාසය හරි වැරදි බැලීම
iv. අධිසන්ධාන ඇතුළත්කිරීම

31. වදන් සකසන මෘදුකාංගයක් භාවිතයෙන් සකසන ලේඛනයක පේළි සහ ඡේද අතර පරතරය තැබීම සඳහා භාවිතා කළ හැකි නිරූපකය කුමක්ද?
i.  ii.  iii.  iv. 

ඉහත Excel වැඩපත ඇසුරින් පහත 32,33 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | 3 | 5 | 15 | |
| 2 | | 10 | 30 | |
| 3 | | 15 | 45 | |
| 4 | | | | |
| 5 | Maximum | | 45 | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |

32. C2,C3 කෝෂවල දැක්වෙන පිළිතුරු ලබා ගැනීමට පිටපත් කළහැකි වන පරිදි C1 කෝෂයෙහි ලිවිය යුතු සූත්‍රය වන්නේ,
i. =A1*B1
ii. =A$1*B1
iii. =A1*$B1
iv. =A$1*$B$1

33. C තීරුවේ උපරිම අගය C4 කෝෂයට ලබා ගැනීමට ලිවිය යුතු ශ්‍රිතය වන්නේ,
i. =MAX(C1:C3)
ii. =MAX(C1-C3)
iii. =MIN(C1:C3)
iv. =COUNT(C1:C3)

34. Portrait හා Landscape යනු,
i. කොළයේ ප්‍රමාණය
ii. පිටුවේ දිශානතිය
iii. පිටුවේ පිරිසැලසුමයි
iv. ඉහත සියල්ලම

35. දෘඩාංග හා පරිශීලකයා අතර අන්තර් සම්බන්ධතා ඇති කිරීමට යොදා ගනු ලබන මෘදුකාංග වර්ගය වන්නේ,
i. යෙදුම් මෘදුකාංග
ii. භාෂා පරිවර්තන
iii. උපයෝගිතා මෘදුකාංග
iv. පද්ධති මෘදුකාංග

36. මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයන් වන්නේ පහත සඳහන් කවරක්ද?

a) පරිගණක පද්ධතියේ දෘඩාංග පාලනය කිරීම
b) ආරක්ෂණ කළමනාකරණය
c) මිත්‍රශීලී පරිශීලක අතුරුමුහුණතක් ලබා දීම

i. a,b ii. a,b,c iii. a,c iv. b,c

37. උපයෝගීතා වැඩසටහනක් ලෙස සැලකිය නොහැක්කේ,

i. තැටි සුපරීක්ෂණය
ii. උපස්ථ මෘදුකාංග
iii. තැටි ප්‍රතිභාගීකරණය
iv. පාඨ සංස්කරණය

38. පැස්කල් ප්‍රකාශනයක 25 DIV 2 හි ප්‍රත්දානය කුමක්ද?

i. 12 ii. 1 iii. 12.5 iv. 12.6

39. 0-20 දක්වා ව ඇති ඉරට්ටෙ සංඛ්‍යා නිරූපණය සඳහා ලියා ඇති පහත පැස්කල් ක්‍රමලේඛනයෙහි හිස්තැන් වලට සුදුසු පිළිතුර තෝරන්න.

```
Program loopone;
Var
…………………….
Begin
a:=0;
while a <20 do
begin
writeln('value of a:',a);
…………………………….
Readln;
End;
End.
```

i. a:integer හා a:=a+2
ii. a:integer; හා a:=a+1;
iii. a:String; හා a:=a+2
iv. a:real; හා a:=a+1;

40. වරකට එක් පේළිය බැගින් පරිවර්තනය කිරීමට සහාය වන්නේ,

i. සම්පාදක
ii. ඇසෙම්බ්ලර්
iii. අර්ථ විනාසක
iv. භාෂා පරිවර්තක

(ල.1x40=**40**)

---

## II කොටස **කාලය: පැය 02**

❖ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**01).** කෙටි හා නිශ්චිත පිළිතුරු සපයන්න.

i. 67යන අෂ්ඨක අගය, ෂඩ් දශමය බවට පරිවර්තනය කරන්න.අදාළ පියවර දක්වන්න.

ii. පහත දැක්වෙන තාර්කික පරිපථයේ ප්‍රතිදානය F වේ. F හි අගය දැක්වීමට නිවැරදි බූලිය ප්‍රකාශය සඳහන් කරන්න.




iii. කැතෝඩ කිරණ නල සංදර්ශකය (CRT) හා ද්‍රව ස්ඵටික සංදර්ශකය (LCD) අතර ඇති වෙනස්කම් 2 ක් ඉදිරිපත් කරන්න.

iv. මාර්ග ගත සාප්පු සවාරිය කෙටියෙන් හඳුන්වන්න. එහි වාසි මොනවාද ?

v. පහත දැක්වෙන වගුවෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරන ක්ෂේත්‍ර කිහිපයක් දැක්වේ . එම ක්ෂේත්‍ර යොදාගන්නා අවස්ථා හඳුනාගෙන ගැළපෙන පරිදි අදාළ අක්ෂරය ලියන්න.

| ක්ෂේත්‍රය | යොදාගන්නා අවස්ථා |
|---|---|
| 1.කර්මාන්ත ක්ෂේත්‍රය | A.අන්තර්ජාලය හරහා බිල්පත් ගෙවීම |
| 2.අධ්‍යාපන ක්ෂේත්‍රය | B.රොබෝ තාක්ෂණය |
| 3.ප්‍රවාහන ක්ෂේත්‍රය | C.ඉගෙනුම් කළමණාකරණ පද්ධති |
| 4.බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රය | D.අන්තර්ජාලය හරහා ගුවන් ටිකට් වෙන්කිරීම |

vi. පරිගණක ක්‍රමලේඛයක් සකස් කිරීමේදී ඇල්ගොරිතමයක් ගොඩ නැඟීම අත්‍යවශ්‍ය සාධකයයි.

a. ඇල්ගොරිතමයක් යනු කුමක්ද?

b. ඇල්ගොරිතම ගොඩනැඟීමට භාවිතා කරන ක්‍රමවේද 2ක් ලියන්න.

vii. සට්ටනය සහිත හා සට්ටනය රහිත මුද්‍රණ යන්ත්‍ර වල වෙනස්කම් 2ක් ලියා උදාහරණය බැගින් ලියන්න.

viii. විධාන රේඛා අතුරු මුහුණත හා රූපක අතුරු මුහුණත අතර වෙනස්කම් 3ක් ලියන්න

ix. දත්ත ගුප්තකේතනය යනු කුමක්ද?

x. පහත වගුවේ(A) කොටසේ මෙහෙයුම් පද්ධති වල ක්‍රියා කාරීත්වය අනුව ඒවා වර්ග කර ඇත .ඒවා මගින් සපයනු ලබන සේවාවල ස්වරූපය,B කොටස තුළ දී ඇති ලැයිස්තුවෙන් තෝරා සම්පූර්ණ කරන්න.

(පරිශීලකයින් විශාල පිරිසකට සේවය සපයයි,එක් වරකට එක් පරිශීලකයකුට පමණක් සේවය සපයයි,එකවර කාර්යයන් සමූහයක් සිදු කරයි ,ආදාන ලැබූ සැනින් ප්‍රතිචාර දක්වයි)

| (A) කොටස | (B) කොටස |
|---|---|
| බහු කාර්යය මෙහෙයුම් පද්ධති)Multi Tasking) | |
| බහු පරිශීලක මෙහෙයුම් පද්ධති (Multi User) | |
| තත්‍ය කල මෙහෙයුම් පද්ධති)Real Time) | |
| ඒක පරිශීලක මෙහෙයුම් පද්ධති(Single User) | |

(ල.2x10=**20**)

**02).**

1. ඉ-රාජ්‍ය යන්න හඳුන්වන්න. (ල.1)
2. ඉ-රාජ්‍ය මඟින් ව්‍යාපාර වලට සපයනු ලබන සේවා 2ක් ලියන්න (ල.2)
3. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමේ වාසි 04ක් ලියන්න. (ල.2)
4. කෘෂිකර්මාන්තයේ දී තොරතුරු තාක්ෂණය යොදා ගන්නා අවස්ථා සඳහා උදාහරණ 04ක් ලියන්න. (ල.2)
5. තොරතුරු තාක්ෂණය භාවිතයේ අහිසි ප්‍රතිඵල පිළිබඳ කෙටියෙන් විමසන්න. (ල.3)

(මුළු. ල.=**10**)

**03).** පහත දක්වා ඇති විද්‍යුත් පැතුරුම්පත ඇසුරින් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | මාසය | මුළු ආදායම | මුළු වියදම | දළ ලාභය | සංචිත වෙන්කිරීම | ශුද්ධ ලාභය | |
| 2 | ජනවාරි | 50000 | 45000 | 5000 | 250 | 4750 | |
| 3 | පෙබරවාරි | 48000 | 42500 | 5500 | 275 | 5225 | |
| 4 | මාර්තු | 47000 | 43000 | 4000 | 200 | 3800 | |
| 5 | අප්‍රේල් | 63000 | 54000 | 9000 | 450 | 8550 | |
| 6 | | | | | | | |
| 7 | සංචිත වෙන්කිරීම | | 5% | | | | |
| 8 | | | | | | | |

1. දළ ලාභය මත 5% ක් සංචිත සඳහා වෙන් කරන්නේ නම් E2 කෝෂය මත ලිවිය යුතු සූත්‍රය වන්නේ කුමක්ද?(කෝෂ ලිපින පමණක් භාවිතා කරන්න) (ල.2)
2. එම සූත්‍රය E5 කෝෂය දක්වා පිටපත් කරන්නේ නම් එහි පියවර දක්වන්න. (ල.3)
3. ශුද්ධ ලාභය ගණනය කරන්නේ **"දළ ලාභය - සංචිත වෙන්කිරීම "**සමීකරණය ඇතුළත් කිරීම මඟින් නම්, එය F5 දක්වා පිටපත් කළ විට F5 කෝෂයේ දැක්වෙන සමීකරණය වන්නේ කුමක්ද? (ල.2)
4. අඩුම ශුද්ධ ලාභයක් ලැබූ මාසය සෙවීම සඳහා F6 කෝෂයට ඇතුළත් කළ යුතු ශ්‍රිතය කුමක්ද? (ල.2)
5. ජනවාරි සිට අප්‍රේල් දක්වා ශුද්ධ ලාභය දැක්වීම සඳහා සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක්ද? (ල.1)

(මුළු. ල.=**10**)

**04).** පහත දැක්වෙන Ms_Access දත්ත පාදක වගු ඇසුරින් අසාඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

Student_Table(ශිෂ්‍ය වගුව)

| St_No | St_Name | DOB | Sex | Course_ID |
|---|---|---|---|---|
| 1101T | Amara | 12/09/97 | Male | CTS110 |
| 1102T | Namal | 03/11/97 | Male | CTS110 |
| 1103T | Ruwan | 15/02/96 | Male | PQS113 |
| 1104T | Sunil | 05/08/97 | Male | NOS116 |
| 1105T | Aruni | 30/05/96 | Female | PQS113 |
| 1106T | Nuwani | 22/06/97 | Female | CTS110 |

Course_Table (පාඨමාලා වගුව)

| Course_ID | Course_Name | Duration | Fee |
|---|---|---|---|
| CTS110 | Office | 03 months | Rs.8000.00 |
| PQS113 | Diploma | 06 months | Rs.12000.00 |
| NOS116 | Graphic | 06 months | RS.16000.00 |

1. Student_Table හා Course_Table සඳහා ප්‍රාථමික යතුර බැගින් ලියන්න. (ල.2)
2. මෙහි ඇති ආගන්තුක යතුරක් නම්කරන්න. (ල.1)
3. කසුන් නැමැති සිසුවා (1997/12/05) Office පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වූයේ නම් යාවත්කාලීන වන වගුව/වගු යාවත්කාලීන කර දක්වන්න. (ල.2)
4. ශිෂ්‍ය වගුව හා පාඨමාලා වගුව අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? (ල.1)
5. දත්ත අනුපිටපත්වීමේ අවාසි 02ක් ලියන්න. (ල.2)
6. දත්ත සමුදායක ලක්ෂණ 2ක් ලියන්න. (ල.2)

**(මුළු. ල.=10)**

**05).**

1. පරිගණක ජාලගත කිරීමේ වාසි 2ක් ලියන්න. (ල.2)
2. ගිණිපවුර යනු කුමක්ද?කෙටියෙන් පහදන්න. (ල.2)
3. දත්ත සම්ප්‍රේෂණය සඳහා යොදාගනු ලබන නියමු මාධ්‍ය හා නියමු නොවන මාධ්‍ය උදාහරණ සමඟින් කෙටියෙන් පහදන්න. (ල.4)
4. සේවාලාභී පරිගණක හා සේවා යෝජිත පරිගණක යනු මොනවාද? (ල.2)

**(මුළු. ල.=10)**

**06).**

1. සංඛ්‍යා දෙකක් අතුරින් විශාල සංඛ්‍යාව සෙවීම සඳහා වන ව්‍යාජ කේතය ලියන්න. (ල.4)

2.පහත පැස්කල් ක්‍රමලේඛනයෙහි ප්‍රතිදානය ලියන්න. (ල.2)

```
Program mynewloop;
Var
a:integer;
begin
a:=10;
while a<20 do
begin
writeln('Value of a:',a);
readln;
end;
end.
```

3. ඉහත පැස්කල් ක්‍රමලේඛනයට අදාළ ගැලීම් සටහන (Flow Chart) අඳින්න. (ල.4)

**(මුළු. ල.=10)**

**07).** පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා විදුහල්පතිතුමා විසින් තොරතුරු තාක්ෂණ විෂය හදාරණ සිසුන්ට කාර්යයන් කිහිපයක් බෙදා දෙන ලදි.එම කාර්යයන් සිදුකරගැනීමට සිසුන් යොදා ගනු ලබන මෘදුකාංග මොනවාදැයි ලියා දක්වන්න.

1. නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා න්‍යාය පත්‍රයක් සකස් කිරීම (ල.2)
2. නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා වියදම් ආදායම් ඇස්තමේන්තුවක් සකස්කිරීම (ල.2)
3. පාසල් සංවර්ධන සමිතියට පසුගිය නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ සුවිශේෂී අවස්ථා ප්‍රදර්ශනය කිරීම. (ල.2)
4. එක් එක් නිවාස භාර ගුරුභවතුන්ගේ හා සිසුන්ගේ දත්ත පාදකයක් නිර්මාණය කිරීම (ල.2)
5. නිවාසාන්තර ක්‍රීඩා උළෙල සඳහා ආරාධනා කරමින් එකම ලිපිය නිලධාරීන් 20 දෙනෙකුට යැවීම සඳහා යොදා ගනු ලබන මෘදුකාංගය හා එහි ඒ සඳහා ඇති සුවිශේෂී පහසුකම ලියාදක්වන්න. (ල.2)

**(මුළු. ල.=10)**